කාර්ය සාධන වාර්තාව
நிதிச் செயலாற்றுகைக் கூற்று
# PERFORMANCE REPORT

# 2022

## කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
## கொம்ப்ரோலர் ஜெனரல் அலுவலகம்
## COMPTROLLER GENERAL'S OFFICE

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
**Ministry of Finance, Economic Stabilization and National Policies**

# කාර්ය සාධන වාර්තාව
# 2022

## කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති
අමාත්‍යාංශය

## පටුන

| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|


**01: ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 1 - 1 |
| 1.2 | දැක්ම හා මෙහෙවර | 2 - 2 |
| 1.3 | පරමාර්ථ, ප්‍රධාන ක්‍රියාවන් හා ප්‍රධාන කාර්යයන් | 2 - 4 |
| 1.4 | සංවිධාන සටහන | 4 - 4 |

**02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

| | | |
|---|---|---|
| 2.1 | රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම | 5 - 9 |
| 2.2 | රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | 9 - 12 |
| 2.3 | මූල්‍ය නොවන වත්කම් විකිණීමේ ආදායම | 12 - 12 |
| 2.4 | අභියෝග සහ අනාගත අරමුණු | 13 - 13 |

**03: 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

| | | |
|---|---|---|
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 14 - 14 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 15 - 15 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 16 - 16 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 17 - 17 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 17 - 17 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 17 - 17 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 18 - 18 |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 18 - 18 |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 18 - 18 |

| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|


**04: කාර්ය සාධන දර්ශක**

| | | |
|---|---|---|
| 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක | 19 - 19 |

**05: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

| | | |
|---|---|---|
| 5.1 | හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු | 20 - 21 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 21 - 21 |

**06: මානව සම්පත් පැතිකඩ**

| | | |
|---|---|---|
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 22 - 22 |
| 6.2 | ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය | 22 - 22 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 22 - 23 |

**07: අනුකූලතා වාර්තාව** 24 - 30

**වගු**

| | | |
|---|---|---|
| 2.1 | රජයට අයත් සමස්ත මෝටර් වාහන සංඛ්‍යාව | 6 - 6 |
| 2.2 | රජයට අයත් සමස්ත මෝටර් වාහන සංඛ්‍යාව ආයතන වශයෙන් වෙන් කිරීම | 6 - 6 |
| 2.3 | රජයට අයත් සමස්ත මෝටර් වාහන සංඛ්‍යාවෙහි වයස් විශ්ලේෂණය | 7 - 7 |
| 2.4 | කුළියට ලබාදී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය | 8 - 8 |
| 2.5 | රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ සාරාංශය | 9 - 9 |
| 2.6 | ධාවන තත්ත්වයේ නොපැවති වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම පිළිබඳ ප්‍රගතිය | 10 - 10 |
| 2.7. | හඳුනාගත් අබලි ද්‍රව්‍ය ප්‍රමාණය සහ අපහරණ ආදායම පිළිබඳ සාරාංශය | 12 - 12 |
| 2.8 | ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම | 12 - 12 |

# 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
# වැය ශීර්ෂ අංකය 333

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

2017 අයවැය යෝජනා අංක 368 අනුව, රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය 2017 මාර්තු 07 වන දින පිහිටුවන ලදි. රජයේ වත්කම් හා පිරිවැය කළමනාකරණය පිළිබඳව අධීක්ෂණය කිරීම කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව, රජයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳව යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම සහ නිසි පරිදි ප්‍රයෝජනයට නොගත්තා සම්පත් හඳුනාගනිමින් හා මෙම වත්කම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරමින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

රජයේ වත්කම් කාර්යක්ෂමව භාවිත කිරීම, වත්කම් නිසි ලෙස ආරක්ෂා කිරීම සහ වත්කම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් කාර්යක්ෂම ක්‍රමවේදයකට අනුගත වීම සඳහා කටයුතු කිරීමට වෙන් වූ ආයතනයක් නොමැතිවීම හේතුවෙන් රජයේ මූල්‍ය නොවන වත්කම් වල තත්ත්වය සහ ඵලදායීව යොදවා ගැනීම පිරිහී ඇති බැවින්, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය රජයේ ප්‍රමුඛතම කාර්යයක් බවට පත් වී ඇත. රාජ්‍ය ආයතන (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) සතුව පවතින මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ලේඛන පවත්වා ගැනීම එම ආයතනවල වගකීම වන නමුත් එම කටයුතු නියි ලෙස සිදුකර නොමැති අතර එම තොරතුරු මධ්‍යගතව වාර්තා කිරීම සඳහා වන විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා වන කේන්ද්‍රගත ආයතනයක් නොමැතිවීම, එම වත්කම් වල වටිනාකම කාලානුරූපව තක්සේරු නොකිරීමට හේතු වී ඇති බැවින් එම වත්කම්වල නිවැරදි වටිනාකම නිසි ලෙස වාර්තා කිරීම ද සිදු වී නොමැත.

තවද, මූල්‍ය නොවන වත්කම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම තහවුරු කිරීම සඳහා 2018 ජනවාරි මස 01 වන දින සිට රජයේ ආයතනවල මූල්‍ය නොවන වත්කම් විකිණීමේ ඇදායම් ගණන් දීමේ නිලධාරී ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් පත් කර ඇත.

## 1.2. දැක්ම හා මෙහෙවර

### (අ) දැක්ම

රාජ්‍ය අංශයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා ලොව පිළිගත් ඉහළම මට්ටමේ ආයතනයක් වීම.

### (ආ) මෙහෙවර

රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම, රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා රජයේ මූල්‍ය නොවන වත්කම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස උපයෝජනය තහවුරු කරමින් මෙම වත්කම් කළමනාකරණය පිළිබඳ පිළිගත් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සහ රජයේ ආයතන සතු මූල්‍ය නොවන වත්කම් විකිණීම් වලින් නිසි පරිදි ආදායම් එකතු කිරීම.

## 1.3 පරමාර්ථ, ප්‍රධාන ක්‍රියාවන් හා ප්‍රධාන කාර්යයන්

### (අ) පරමාර්ථ:

(i) රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන)

අ. සියලුම මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ආ. මූල්‍ය නොවන වත්කම් ඵලදායී හා කාර්යක්ෂම උපයෝජනය තුළින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

ඇ. මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම නිවැරදිව වාර්තා කිරීම තහවුරු කිරීම.

ඈ. මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ නායකත්ව සහ භාරකාර භූමිකාව ඉටුකිරීම.

(ii) රජයේ ආයතන සතු මූල්‍ය නොවන වත්කම් විකිණීම්වලින් නිසි පරිදි ආදායම් එකතු කිරීම.

(ආ) ප්‍රධාන ක්‍රියාවන්:

(i) රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

අ. සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම හා ලේඛණගත කර පවත්වාගැනීම සඳහා (වත්කම්වල වටිනාකම සහිතව වාර්තා කිරීමට හැකිවන පරිදි) යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) පවත්වාගැනීම සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

ආ. ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම: අනිසි කළමනාකරණය, නාස්තිය හා රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම වැලැක්වීමට, මූල්‍ය නොවන වත්කම් උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීම සහ වියදම් කළමනාකරණය සඳහා.

(ii) රජයේ ආයතන සතු මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම සඳහා ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කිරීම.

(ඇ) ප්‍රධාන කාර්යයන්:

අ. රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳව විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) ඇතිකිරීම හා යාවත්කාලීන කර පවත්වාගැනීම සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

ආ. ප්‍රතිපත්ති සහ රෙගුලාසි සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම හා චක්‍රලේඛ නිකුත් කිරීම.

ඇ. රජයේ වත්කම් අත්පත් කරගැනීම, පවත්වාගැනීම සහ අපහරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

ඈ. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දැනුවත් භාවය වැඩිදියුණු කිරීම සහ මෙම වත්කම් උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීම සඳහා අවශ්‍ය හොඳම භාවිතයන් හඳුන්වාදීම.

ඉ. රජයේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු ලබාදීම.

ඊ. රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන වාහනවල නෛතික අයිතිය පිළිබඳව පවතින ගැටළු නිරාකරණය කිරීම.


උ. රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන් සපුරාලීමට මූල්‍ය නොවන වත්කම් වෙන්කර දීම.

ඌ. රජයේ ආයතන සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනවල වාහන මිලදීගැනීම සඳහා නිර්දේශ ලබාදීම.

එ. රජයේ ආයෝජන හා රාජ්‍ය මූල්‍ය ශේෂයන් සඳහා සහායවීමට, නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම් හඳුනා ගැනීම සහ අදාල තොරතුරු සැපයීම / රෙගුලාසි නිකුත් කිරීම.

ඒ. රජයේ ආයතන සතු මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම එකතු කිරීම හා වාර්තා කිරීම.

## 1.4 සංවිධාන සටහන



## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම තහවුරු කිරීම සඳහා, මෙම වත්කම් පිළිබඳව යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම සහ නිසි පරිදි ප්‍රයෝජනයට නොගන්නා සම්පත් හඳුනාගනිමින් හා මෙම වත්කම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරමින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

### 2.1. රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා යාවත්කාලීන කළ විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම

පළමු අදියර ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2014 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන අත්පොතෙහි වත්කම් ක්ෂේත්‍ර වර්ගීකරණය පදනම් කර ගනිමින්, රජයේ මූල්‍ය නොවන වත්කම්, එනම් වාහන, ගොඩනැගිලි, ඉඩම්, ඉදිකිරීම්, පිරියත හා යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳව මූලික තොරතුරු රැස් කිරීම සඳහා උපදෙස් ලබාදීම පිණිස 2017 ජූනි 28 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක. 01/2017 නිකුත් කරන ලදී.

**(අ) විස්තීර්ණ මධ්‍යගත මාර්ගගත (Online) දත්ත පද්ධතියක් හා කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම**

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම සඳහා විස්තීර්ණ මධ්‍යගත මාර්ගගත (Online) දත්ත පද්ධතියක් හා කළමනාකරණ ක්‍රමවේදයක් ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් තොරතුරු පද්ධතිය (ITMIS) මඟින් ස්ථාපිත කිරීමට දැඩි ප්‍රයත්නයක් දැරුවද එය අභියෝගයක් වී ඇති බැවින්, මේ සඳහා මාර්ගගත දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා කරමින් පවතී.

**(ආ) මධ්‍යගත දත්ත පද්ධතිය - මෝටර් වාහන**

වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 අනුව, 2017 දෙසැම්බර් 31 දිනට වාර්තා කරන ලද පරිදි රජයේ ආයතන හා රාජ්‍ය ව්‍යාපාර සතු මෝටර් වාහන සහ 2018 අප්‍රේල් 24 දිනට වාර්තා කරන ලද පරිදි පළාත් සභා හා පළාත් පාලන ආයතන සතු මෝටර් වාහන පිළිබඳ තොරතුරු ඇතුලත් කරමින් වගුව 2.1හි සඳහන් පරිදි මෝටර් වාහන පිළිබඳ දත්ත පද්ධතිය ප්‍රථමයෙන් සකස්කර එම තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

2019 දෙසැම්බර් 31 දිනට සහ 2021 දෙසැම්බර් 31 දිනට මෝටර් වාහන පිළිබඳ දත්ත පද්ධතිය වගුව 2.1හි දක්වා ඇති පරිදි යාවත්කාලීන කරන ලදී. 2017 වර්ෂයේ 64,518 ක් වූ ධාවනය කළ හැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන සංඛ්‍යාව, 2019 වර්ෂය අවසන් වන විට 76,661 ක් දක්වා සහ 2021 වර්ෂය අවසානය වන විට 77,678 ක් දක්වා වැඩිවී ඇත.

2017 වර්ෂයේ දී 9,303ක් වූ රජයට අයත් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන සංඛ්‍යාව 2019 වර්ෂය අවසානය වන විට 5,533ක් දක්වා අඩු වී ඇති අතර 2021 වර්ෂය අවසානය වන විට 6,569ක් දක්වා වැඩි වී ඇත.

ඒ අනුව, 2017 වර්ෂයේ දී 73,821ක් වූ රාජ්‍ය ආයතන සතු / භාවිතා කල මෝටර් වාහන සංඛ්‍යාව 2019 වර්ෂය අවසන් වන විට 82,194 ක් දක්වා සහ 2021 වර්ෂය අවසන් වන විට 84,247ක් දක්වා වැඩි වී ඇත.

**වගුව 2.1: රජයට අයත් සමස්ත මෝටර් වාහන සංඛ්‍යාව**

| | **2017** අ | **2019.12.31** දිනට | **2021.12.31** දිනට |
|---|---|---|---|
| **ධාවනය කළ හැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන** | ***64,518*** | ***76,661*** | ***77,678*** |
| රජයේ ආයතන හා රාජ්‍ය ව්‍යාපාර | 50,160 | 60,326 | 61,249 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 14,358 | 16,335 | 16,429 |
| **ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන** | ***9,303*** | ***5,533*** | ***6,569*** |
| රජයේ ආයතන හා රාජ්‍ය ව්‍යාපාර | 7,723 | 3,839 | 4,889 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 1,580 | 1,694 | 1,680 |
| **මුළු එකතුව** | ***73,821*** | ***82,194*** | ***84,247*** |

අ - රජයේ ආයතන හා රාජ්‍ය ව්‍යාපාර - 2017.12.31 දිනට වාර්තා කළ පරිදි
පළාත් සභා හා පළාත් පාලන ආයතන - 2018.04.24 දිනට වාර්තා කළ පරිදි

2021 දෙසැම්බර් 31 දිනට පැවති රජයේ මෝටර් වාහන, ආයතන වශයෙන් වෙන්කර දීම සහ වයස් විශ්ලේෂණය පිළිබඳ තොරතුරු පිළිවෙලින් වගුව 2.2 සහ වගුව 2.3 හි සඳහන් පරිදි වේ

**වගුව 2.2 : රජයට අයත් සමස්ත මෝටර් වාහන සංඛ්‍යාව ආයතන වශයෙන් වෙන් කිරීම- 2021.12.31 දිනට**

| රාජ්‍ය ආයතන | | ධාවන තත්ත්වයේ පවතින වාහන | ධාවන තත්ත්වයේ නොපවතින වාහන | එකතුව |
|---|---|---|---|---|
| **රජයේ ආයතන** | | **45,922** | **3,097** | **49,019** |
| අ) | අමාත්‍යාංශ | 3,697 | 88 | **3,785** |
| ආ) | විශේෂ වියදම් ඒකක | 1,209 | 18 | **1,227** |
| ඇ) | දෙපාර්තමේන්තු | 18,691 | 1,251 | **19,942** |
| ඈ) | විදේශ තානාපති කාර්යාල | 158 | 7 | **165** |
| ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 1,420 | 154 | **1,574** |
| ඊ) | විශ්ව විද්‍යාල සහ ඒ යටතේ ඇති අනෙකුත් ආයතන | 1,054 | 53 | **1,107** |
| උ) | ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය | 19,693 | 1,526 | **21,219** |
| **රාජ්‍ය ව්‍යාපාර** | | **15,327** | **1,792** | **17,119** |
| **පළාත් සභා හා පළාත් පාලන ආයතන** | | **16,429** | **1,680** | **18,109** |
| අ) | මධ්‍යම පළාත් සභාව | 1,830 | 189 | **2,019** |
| ආ) | නැගෙනහිර පළාත් සභාව | 1,735 | 446 | **2,181** |
| ඇ) | උතුරු මැද පළාත් සභාව | 892 | 45 | **937** |
| ඈ) | වයඹ පළාත් සභාව | 1,578 | 53 | **1,631** |
| ඉ) | උතුරු පළාත් සභාව | 2,046 | 380 | **2,426** |
| ඊ) | සබරගමුව පළාත් සභාව | 1,284 | 81 | **1,365** |
| උ) | දකුණු පළාත් සභාව | 1,711 | 234 | **1,945** |
| ඌ) | ඌව පළාත් සභාව | 1,084 | 49 | **1,133** |
| එ) | බස්නාහිර පළාත් සභාව | 4,269 | 203 | **4,472** |
| **එකතුව** | | **77,678** | **6,569** | **84,247** |

වගුව **2.3** : රජයට අයත් සමස්ත මෝටර් වාහන සංඛ්‍යාවෙහි වයස් විශ්ලේෂණය-2021.12.31 දිනට

| වාහන වර්ගය | වසර 0 - 5 | වසර 6 - 10 | වසර 10ට වඩා පැරණි | ලි.ප. වර්ෂය සඳහන් නොකරන ලද | එකතුව |
|---|---|---|---|---|---|
| SUV | 107 | 565 | 3995 | 135 | 4802 |
| මෝටර් කාර් | 361 | 1994 | 5250 | 340 | 7945 |
| ඩබල් කැබ් | 427 | 2470 | 7333 | 558 | 10785 |
| වෑන් | 188 | 644 | 2208 | 217 | 3257 |
| සිංගල් කැබ්/ද්විත්ව කාර්යය මෝටර් වාහන | 282 | 988 | 4466 | 255 | 5991 |
| බස් | 384 | 1459 | 2933 | 3554 | 8330 |
| කෘ කැබ් | 03 | 25 | 46 | 5 | 79 |
| මෝටර් ලොරි | 514 | 1387 | 3665 | 206 | 5772 |
| ට්‍රැක්ටර් | 109 | 864 | 4261 | 479 | 4261 |
| වෙනත් වාහන | 6832 | 7381 | 16360 | 2399 | 33022 |
| **මුළු එකතුව** | **9,257** | **17,777** | **47,074** | **10,139** | **84,247** |

**(ඈ) මධ්‍යගත දත්ත පද්ධතිය - ගොඩනැගිලි**

2017 ජූනි 28 වන දින නිකුත් කල වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017, 2020 ජනවාරි 03 වන දින නිකුත් කල වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017(1) සහ 2021 පෙබරවාරි 18 වන දින නිකුත් කල වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2021 මගින් රජයේ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදී ඇත. කෙසේ වෙතත්, බොහොමයක් රාජ්‍ය ආයතන විසින් එම තොරතුරු ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය වූ බැවින්, 2022 ජනවාරි මස 03 වන දින නිකුත් කල වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2022 මගින් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව, රාජ්‍ය ආයතන විසින් වාර්තා කර ඇති පරිදි 2021 දෙසැම්බර් 31 දිනට, කුළියට ලබා දී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය වගුව 2.4හි සඳහන් පරිදි වේ. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට, රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලිවල භාවිතා කරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 57.1ක් හා කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලිවල භාවිතා කරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 2.9ක් වන අතර ඒ සඳහා වැයවන වාර්ෂික වියදම රු. බිලියන 11.6ක් වේ. මේ අතර, භාවිතා නොකරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 0.8ක් පමණ වේ. තවද, රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලිවල බිම් ප්‍රමාණයෙන් වර්ග මීටර් මිලියන 1.7ක් කුළියට ලබාදී ඇති අතර එමගින් රාජ්‍ය ආයතනවලින් රු. බිලියන 6.2ක හා පෞද්ගලික ආයතනවලින් රු. බිලියන 3.1ක වාර්ෂික ආදායමක් උපයා ඇත.

ඒ අනුව, එම තොරතුරු ඇතුලත් කරමින් ගොඩනැගිලි පිළිබඳ මධ්‍යගත දත්ත පද්ධතිය සකස් කර එම තොරතුරු 2022 ඔක්තෝබර් මස 11 වන දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. තවද, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2022 මගින් ලබාදී ඇති උපදෙස් අනුව තොරතුරු ඉදිරිපත් කර නොමැති හෝ නිවැරදි තොරතුරු ඉදිරිපත් කර නොමැති රාජ්‍ය ආයතන වෙත අදාල

තොරතුරු ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබාදෙමින් 2022 නොවැම්බර් 22 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 12/2022 නිකුත් කරන ලදී.

**වගුව 2.4:** කුළියට ලබාදී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය - 2021.12.31 දිනට

| රාජ්‍ය ආයතනය | භාවිත කරනු ලබන බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | | | භාවිත නොකරනු ලබන බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | වාර්ෂික කුළී/බදු වියදම් (රු. මිලි.) | බදු දී ඇති ස්ථාන | |
|---|---|---|---|---|---|---|---|
| | අයිතිය සතු | කුළියට/ බද්දට | එකතුව | | | බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | වාර්ෂික ආදායම් (රු. මිලි.) |
| රජයේ ආයතන සහ රාජ්‍ය ව්‍යාපාර | 46,041,744 | 2,680,256 | 48,722,000 | 596,855 | 11,439.6 | 970.225 | 3,564.2 |
| පළාත් සභා සහ පළාත් පාලන ආයතන | 11.137,528 | 200,502 | 11,338,030 | 188,345 | 148.4 | 721,656 | 749.6 |
| එකතුව | **57,179,272** | **2,880,758** | **60,060,030** | **785,200** | **11,588.0** | **1,691,881** | **9,313.8** |

සටහන: ගරාජ, නිල නිවාස, සංචාරක බංගලා, නිවාඩු නිකේතන සහ අනෙකුත් එවැනි නේවාසික නොවන ගොඩනැගිලිවල තොරතුරු මෙම තොරතුරු වලට ඇතුලත් නොවේ.

තවද, 2023 ජනවාරි 18 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2023 නිකුත් කර රජයේ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු 2022 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කර ඉදිරිපත් කරන ලෙසට සියළුම රාජ්‍ය ආයතන වෙත උපදෙස් ලබාදී ඇත.

**(ඇ) මධ්‍යගත දත්ත පද්ධතිය - ඉඩම්**

2017 ජුනි 28 වන දින නිකුත් කල වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 මගින් රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදී තිබුනද බොහොමයක් රාජ්‍ය ආයතන විසින් එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුනි. ඒ අනුව, රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතිය සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු රැස්කිරීමට 2022 ජනවාරි මස 07 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2022 නිකුත් කරන ලදී. ඒ අනුව ඇතැම් රාජ්‍ය ආයතන විසින් තොරතුරු ඉදිරිපත් කරන ලද අතර, රාජ්‍ය ආයතන 740ක් විසින් එම තොරතුරු නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි. තවද, රාජ්‍ය ආයතන 395ක් විසින් ඉඩම් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණි. ඒ අනුව, ඉදිරිපත් කරන ලද තොරතුරු ඇතුලත් කරමින් ඉඩම් පිළිබඳ මධ්‍යගත දත්ත පද්ධතිය සකස් කර එම තොරතුරු 2022 දෙසැම්බර් මස 09 වන දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. 2021 දෙසැම්බර් 31 දිනට පැවති රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ තොරතුරුවල සාරාංශය වගුව 2.5හි සඳහන් පරිදි වේ. ඒ අනුව, රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබාදී ඇති මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර මිලියන 1.49ක් වන අතර එයින් හෙක්ටයාර මිලියන 1.12ක් වනාන්තරවලින් වැසුනු ඉඩම් වේ. වාර්තා කර ඇති ඉඩම් ප්‍රමාණය තුල භාවිතා කරනු ලබන ඉඩම් හෙක්ටයාර මිලියන 1.47ක් හා භාවිතා නොකරනු ලබන ඉඩම් හෙක්ටයාර 13, 702ක් ඇතුලත් වේ. ඉඩම් හෙක්ටයාර 2,537ක ප්‍රමාණය භාවිතා කිරීම පිළිබඳව රාජ්‍ය ආයතන විසින් මෙතෙක් වාර්තා කර නොමැත.

වගුව 2.5: රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ සාරාංශය-2021.12.31 දිනට

| රාජ්‍ය ආයතනය / ඉඩම් භාවිතය | | ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|
| රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය | | **1,490,950** |
| | එයින් වනාන්තර | 1,125,700 |
| i | භාවිත කරනු ලබන | **1,474,711** |
| | රජයේ ආයතන | 1,404,656 |
| | රාජ්‍ය ව්‍යාපාර | 49,563 |
| | පළාත් සභා හා පළාත් පාලන ආයතන | 20,493 |
| ii | භාවිත නොකරනු ලබන | **13,702** |
| | රජයේ ආයතන | 8,826 |
| | රාජ්‍ය ව්‍යාපාර | 4,468 |
| | පළාත් සභා හා පළාත් පාලන ආයතන | 407 |
| iii | භාවිතය පිළිබඳව සඳහන් කර නොමැති | **2,537** |
| | රජයේ ආයතන | 1,147 |
| | රාජ්‍ය ව්‍යාපාර | 1,097 |
| | පළාත් සභා හා පළාත් පාලන ආයතන | 294 |

තවද, 2023 ජනවාරි 18 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2023 නිකුත් කර රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු 2022 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කර ඉදිරිපත් කරන ලෙසට සියළුම රාජ්‍ය ආයතන වෙත උපදෙස් ලබාදී ඇත.

## 2.2. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

### (අ) රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම සහ රජයට ලැබිය යුතු ආදායම අහිමි වීම වැලැක්වීමට රජයේ වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ නොපමාව අපහරණය කිරීම

2018 මාර්තු 19 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2018 නිකුත් කරමින් ධාවන තත්ත්වයේ නොපැවති වාහන අපහරණය කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදී තිබුනද එම උපදෙස් අනුව කටයුතු කිරීමේ ප්‍රගතිය සතුටුදායක නොවීය. ඒ අනුව, 2020 අගෝස්තු 31 දිනට වාර්තා කරන ලද පරිදි එවැනි වාහන පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර එම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම 2020 දෙසැම්බර් 31 දිනට පෙර සිදුකර එම තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා 2021 ජනවාරි 15 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලෙසට රජයේ සියළුම ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් ලබාදෙමින් 2020 ඔක්තෝම්බර් 02 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 නිකුත් කර ඇත.

චක්‍රලේඛ මඟින් නැවත නැවතත් උපදෙස් ලබාදී තිබුනද ඇතැම් රාජ්‍ය ආයතන එම උපදෙස්වලට අනුගත වීමට නිසි සැලකිල්ලක් දක්වමින් අවශ්‍ය කටයුතු සිදු නොකරන බව නිරීක්ෂණය විය. එබැවින්, 2021 දෙසැම්බර් 15 දිනට පැවති ධාවන තත්ත්වයේ නොපැවති වාහන අළුත්වැඩියා කර භාවිතා කිරීමේ හෝ අපහරණය කිරීමේ ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඒ අනුව, ඉතිරි එවැනි වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කඩිනමින්

කටයුතු කරන ලෙසට උපදෙස් ලබාදෙමින් සහ මෙම වත්කම් විනාශ වීමට ඉඩහැරීම සහ රජයට ලැබිය යුතු ආදායම් අහිමි වීම වැලැක්වීම උදෙසා, නිසි පරිදි නඩත්තු කිරීම හා නොසැලකිලිමත් භාවිතයෙන් තොරව වාහන නිසි පරිදි භාවිතා කිරීමට අදාල චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් අවශ්‍ය පරිදි නොපමාව වාහන අපහරණය කිරීම සියලුම රාජ්‍ය ආයතනවල අනිවාර්ය කාර්යයක් බව අවධාරණය කරමින් 2022 ජනවාරි 25 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 නිකුත් කර ඇත.

වගුව 2.6: ධාවන තත්ත්වයේ නොපැවති වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම පිළිබඳ ප්‍රගතිය

| රාජ්‍ය ආයතනය | 2020 අගෝස්තු 31 දිනට වාර්තා කළ පරිදි | | | | | 2023 මැයි 15 දිනට අළුත්වැඩියා කිරීමේ ප්‍රගතිය | | | | | | 2020 අගෝස්තු 31 දිනට වාර්තා කළ පරිදි | | | | | 2023 මැයි 15 දිනට අපහරණය කිරීමේ ප්‍රගතිය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අළුත්වැඩියා කිරීමට ඇති වාහන | | | | | අළුත්වැඩියා කළ වාහන | | | | | අළුත්වැඩියා පිරිවැය (රු.මිලි.) | අපහරණය කිරීමට ඇති වාහන | | | | | අපහරණය කළ වාහන | | | | | අපහරණ ආදායම (රු.මිලි.) |
| | [illegible] | කාර් | මෝටර් සයිකල් | ලොරි | අනෙකුත් | [illegible] | කාර් | මෝටර් සයිකල් | ලොරි | අනෙකුත් | | [illegible] | කාර් | මෝටර් සයිකල් | ලොරි | අනෙකුත් | [illegible] | කාර් | මෝටර් සයිකල් | ලොරි | අනෙකුත් | |
| රජයේ ආයතන සහ රාජ්‍ය ව්‍යවසාය | 485 | 183 | 517 | 148 | 2,253 | 353 | 160 | 433 | 113 | 1,336 | 915 | 380 | 475 | 346 | 142 | 2,893 | 55 | 283 | 138 | 71 | 1,083 | 566 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 24 | 21 | 66 | 29 | 347 | 18 | 21 | 50 | 18 | 179 | 80 | 59 | 45 | 125 | 41 | 924 | 23 | 22 | 35 | 15 | 230 | 68 |
| එකතුව | 509 | 204 | 583 | 177 | 2,600 | 371 | 181 | 483 | 131 | 1,515 | 995 | 439 | 520 | 471 | 183 | 3,817 | 118 | 305 | 173 | 86 | 1,313 | 634 |

වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමෙ 2023 මැයි 15 දිනට ප්‍රගතිය වගුව 2.6 හි සඳහන් පරිදි වේ. ඒ අනුව, 2020 අගෝස්තු 31 දිනට අළුත්වැඩියා කිරීම සඳහා වාහන 5,430 ක් සහ අපහරණය කිරීමට වාහන 4,073 ක් පැවති අතර 2023 මැයි 15 දිනට රු.මිලි. 912ක වියදමෙන් වාහන 2,241ක් අළුත්වැඩියා කර ධාවන තත්ත්වයට පත්කර ඇති අතර වාහන 1,742ක් අපහරණය කර රු.මිලි. 634ක ආදායමක් උපයා ඇත. මීට අමතරව, නිසි පරිදි වාහන අපහරණය සිදු කරනු ලබන බව හා රජයේ ආයතන මඟින් අපහරණය කරනු ලබන වාහනවල ආදායම 20.06.02.01 ආදායම් සංකේතාංකයට නියමිත පරිදි බැර කරනු ලබන බව තහවුරු කර ගැනීම සඳහා 2022 අගෝස්තු 04 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 08/2022 නිකුත් කර ඇත. තවද, වාහන අපහරණයෙන් ලැබිය යුතු ආදායම අහිමිවීම වැළැක්වීම අරමුණු කර ගනිමින්, අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කිරීමට නියමිත වාහනවල ලියාපදිංචි අයිතිය අවලංගු කිරීම තහවුරු කර ගැනීමට උපදෙස් ලබාදෙමින් 2022 සැප්තැම්බර් 16 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 11/2022 ද නිකුත් කරන ලදී.

### (ආ) රජයේ වාහන ප්‍රසම්පාදනය කළමනාකරණය කිරීම

2019 වසර මැද සිට, රජයේ ආයතන සඳහා උපයෝගීතා වාහන හැර අනෙකුත් මෝටර් වාහන ප්‍රසම්පාදනය තාවකාලිකව අත්හිටුවමින් 2019 සැප්තැම්බර් 24 වන දින ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2019 නිකුත් කර ඇත. ඒ අනුව, සංවර්ධන කටයුතු සහ අනෙකුත් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා අවශ්‍ය උපයෝගීතා වාහන සහ ශ්‍රී ලංකා පොලීසියේ භාවිතය සඳහා ආනයනය කරන ලද වාහනද හැර, රජයට අමතර වැය බරක් නොවෙමින් රජයේ වාහන අවශ්‍යතාවය සපුරාලීමට පැවති

වාහන ප්‍රමාණය භාවිතා කරමින් කළමණාකරණය කරන ලදී. රජයේ පවතින උපයෝගීතා වාහන වල ඵලදායි භාවිතය හා අවශ්‍යතාවය තක්සේරු කරමින්, උපයෝගීතා වාහන ප්‍රසම්පාදනය සඳහා 2022 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 137ක් අතරින් උපයෝගීතා වාහන 76ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබා දී ඇත.

(ඈ) රජය සතු මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කරගැනීම

ඇතැම් රාජ්‍ය ආයතන භාවිතා කරන වාහන සැලකිය යුතු ප්‍රමාණයක නීත්‍යානුකූල අයිතිය එම ආයතන සතු නොවන අතර නීත්‍යානුකූල භාරකාරීත්වය වෙනත් ආයතන සතු වන බව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් හඳුනාගන්නා ලදී. එබැවින්, මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිය නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙමින් 2017 දෙසැම්බර් 21 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හා 2018 ඔක්තෝම්බර් 10 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2018 නිකුත් කරන ලදී. ඒ අනුව, 2023 අප්‍රේල් 30 වන විට වාහන 284ක ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිරාකරණය කර ඇති අතර මේ සඳහා 2022 වසර තුල මෝටර් වාහන 54ක් සම්බන්ධයෙන් පැවති ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීමද ඇතුලත් වේ.

(ඈ) රාජ්‍ය ආයතනවල දීර්ඝ කාලයක් ගොඩගැසී පැවති අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම

රාජ්‍ය ආයතනවල දීර්ඝ කාලයක් ගොඩගැසී පැවති අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා වූ 2022 අතුරු අයවැය යෝජනාව ක්‍රියාත්මක කරමින්, මුදල් රෙගුලාසි මත පදනම්ව 2022 සැප්තැම්බර් 09 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 නිකුත් කර 2022 සැප්තැම්බර් 15 දිනට පැවති අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම පිළිබඳ ප්‍රගතිය 2022 නොවැම්බර් 30 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කරන ලෙසට සියළුම රාජ්‍ය ආයතන වෙත උපදෙස් ලබා දෙන ලදී.

මේ අතර, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් වෙත කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් වානේ අබලි ද්‍රව්‍ය ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට 2005 ජූලි 13 හා 2013 ඔක්තෝබර් 17 දිනයන්වලදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් සැලකීමෙන්, 2022 සැප්තැම්බර් 15 දිනට රාජ්‍ය ආයතනවල ගොඩගැසී ඇති අබලි ද්‍රව්‍ය කඩිනමින් ඉවත් කිරීමේ කාර්යය සඳහා පමණක්, ඉහත චක්‍රලේඛයෙන් උපදෙස් ලබාදී ඇති පරිදි එම ලෝහ අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. කෙසේ වෙතත් එම ක්‍රියාපිළිවෙල සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොදෙන ලදී. එබැවින්, වගුව 2.7 හි සඳහන් පරිදි 2022 දෙසැම්බර් 15 දිනට පැවති අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමේ ප්‍රගතිය පිළිබඳව දන්වමින්, ලෝහ අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමේ කාර්යය කර්මාන්ත අමාත්‍යාංශය වෙත පැවරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටින ලදී.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි, කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කරමින් ලෝහ අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට සියළුම රජයේ ආයතන වෙත උපදෙස් ලබාදෙමින් 2023 ජනවාරි 30 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2023 නිකුත් කරන ලදී. 2022 දෙසැම්බර් 15 දිනට වාර්තා කරන ලද පරිදි, අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමෙන් රු.මිලි. 54.4 ක් උපයා ඇත.

**වගුව 2.7: හඳුනාගත් අබලි ද්‍රව්‍ය ප්‍රමාණය සහ අපහරණ ආදායම පිළිබඳ සාරාංශය - 2021.12.15 දිනට**

| විස්තරය | හඳුනාගත් ප්‍රමාණය (මෙ.ටොන්) | අපහරණය කල ප්‍රමාණය (මෙ.ටොන්) | අපහරණ ආදායම (රු.මිලි.) |
|---|---|---|---|
| යකඩ හෝ වානේ | 2,832 | 116 | 12.1 |
| අනෙකුත් ලෝහ | 299 | 40 | 11.7 |
| අනෙකුත් අබලි ද්‍රව්‍ය | - | - | 30.6 |

## 2.3. මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම

2018 මාර්තු 22 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(xii) අනුව, 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය නොවන වත්කම් විකිණීමේ ආදායම් ගිණුම් තැබීම සඳහා ගණන්දීමේ නිලධාරී ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් පත් කර ඇත.

**වගුව 2.8: මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම (රු. මිලි.)**

| විස්තරය | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් විකිණීම් - වාහන | 188.4 | 201.0 | 128.3 | 226.4 |
| මූල්‍ය නොවන වත්කම් විකිණීම් - වෙනත් | 2,685.7 | 56.0 | 60.1 | 357.8 |
| එකතුව | **2,874.1** | **257.0** | **188.4** | **584.2** |

මේ සඳහා, 2022 වර්ෂයට අදාල ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම හා 2021 වර්ෂයට අදාල සංශෝධිත ඇස්තමේන්තු ලබාගැනීම පිළිබඳව අදාල ආයතන වලට උපදෙස් ලබාදීම සඳහා 2021 ජුනි 03 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2021 නිකුත් කරන ලදී. 2023 වර්ෂයට අදාළ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම හා 2022 වර්ෂයට අදාල සංශෝධිත ඇස්තමේන්තු ලබාගැනීම පිළිබඳව අදාල ආයතන වලට උපදෙස් ලබාදීම සඳහා 2022 මැයි 23 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2022 නිකුත් කරන ලදී. තවද, 2022 වර්ෂයේ ජුනි 30 දිනට හිඟ ආදායම්, මුල් මාස හය තුළ රැස්කළ හිඟ ආදායම් හා අදාල කාල පරිච්ඡේදය තුළදී අත්හරිනු ලැබූ ආදායම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා 2022 මැයි 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 07/2022 හා 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම්, 2022 වර්ෂය තුළ රැස්කළ හිඟ ආදායම් හා අදාල කාල පරිච්ඡේදය තුළදී අත්හරිනු ලැබූ ආදායම් පිළිබඳ තොරතුරු ලබාගැනීමට 2022 දෙසැම්බර් 09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 13/2022 නිකුත් කරන ලදී. ඉහත 2.2 (අ) හා 2.2 (ආ) හි සඳහන් පරිදි වාහන සහ අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම කඩිනම් කිරීමට කටයුතු කිරීමද අනුව, වගුව 2.8 හි සඳහන් පරිදි, 2021 වර්ෂයේ රු.මිලි. 188.4ක් වූ ආදායමට සාපේක්ෂව 2022 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම රු.මිලි. 584.2ක් දක්වා වැඩි වී ඇත.

## 2.4 අභියෝග සහ අනාගත අරමුණු

I. ඉඩම්, ගොඩනැගිලි, වාහන, ඉදිකිරීම්, ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ වැනි රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා පුළුල් මධ්‍යම මාර්ග ගත (online) දත්ත පද්ධතියක් හා කළමනාකරණ ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය සෑම උත්සාහයක්ම ගනිමින් පවතී.

II. රජයේ ආයතනවල මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා පමණක් ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් තොරතුරු පද්ධතියේ (ITMIS) වත්කම් මොඩියුලයක් ලෙස ඇතුළත් කර ඇති හෙයින්, රාජ්‍ය ව්‍යාපාර, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා මධ්‍යගත මාර්ගගත වත්කම් කළමනාකරණ මෘදුකාංගයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. එබැවින්, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා වත්කම් කළමනාකරණ මෘදුකාංගයක් නිර්මාණය කිරීම සඳහා කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය ITMIS කණ්ඩායම සහ මෘදුකාංග සංවර්ධන ආයතනය සමග සාකච්ඡා පවත්වන ලදී.

III. රජයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත නොවීම හේතුවෙන් රාජ්‍ය ගිණුම් සැකසීමේදී එම වත්කම්වල සැබෑ වටිනාකම සටහන් නොවන බව සහ මෙම තත්වය රජයේ වත්කම් පිළිබඳව මහජනතාවට වගවීම සම්බන්ධයෙන් සංකීර්ණ ගැටලු සහගත තත්වයක් මතු කරනු ලබන බව නිරීක්ෂණය වේ. මුදල් රෙගුලාසි හෝ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මඟින් මෙම වත්කම්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා උපදෙස් ලබාදී නොතිබුණි. එබැවින්, ඉහත (I) හි සඳහන් වත්කම් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 04/2018, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 02/2019 හා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2021 නිකුත් කර ඇත. තවද, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සහ එම වත්කම්වල වටිනාකම ඇතුලත් වත්කම් කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කිරීම අධීක්ෂණය සහ කඩිනම් කිරීම අවශ්‍ය වේ.

IV. රජයේ ආයතන විසින් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ වලට නියමිත කාලසීමාව තුල අදාල තොරතුරු නිවැරදිව ඉදිරිපත් නොකිරීම හා රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා මධ්‍යගත මාර්ග ගත (online) දත්ත පද්ධතියක් හා තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පවතින බාධාවන්, ප්‍රධාන අභියෝගයන් ලෙස හඳුනාගෙන ඇත.

කොම්ප්ට්‍රොලර් ජනරාල්

# පරිච්ඡේදය 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2022 රු. | | සටහන | සත්‍ය 2022 රු. | සත්‍ය 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | 584,212,973 | 188,384,750 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 584,212,973 | 188,384,750 | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | 584,212,973 | 188,384,750 | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 32,448,000 | 25,395,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 10,050 | 43,448 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 1,729,619 | 3,088,706 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 34,187,669 | 28,527,154 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 618,400,642 | 216,911,904 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 321,569 | 501,703 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 618,079,073 | 216,410,201 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | | |
| 27,300,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 24,577,673 | 19,523,614 | ඒසීඒ-2(ii) |
| 7,730,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 8,774,985 | 5,540,338 | ඒසීඒ-2(ii) |
| 350,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 236,808 | 282,740 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 35,380,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 33,589,466 | 25,346,692 | |
| | මූලධන වියදම් | | | | |
| 100,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 99,506 | - | ඒසීඒ-2(ii) |
| - | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 38,546 | 112,881 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 130,000 | හැකියා වර්ධනය | 14 | 147,420 | 71,000 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| 230,000 | මුළු මූලධන වියදම් (උ) | | 285,472 | 183,881 | |
| | තැන්පතු ගෙවීම් | | 10,050 | 43,448 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 1,838,662 | 2,241,892 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 1,848,712 | 2,285,340 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 35,723,650 | 27,815,913 | |
| 35,610,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 582,355,423 | 188,594,283 | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | 582,355,423 | 188,594,283 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |
| | | | 582,355,423 | 188,594,283 | |

## 3.2 මූල්‍ය තත්ත් ය පිළිබඳ ප්‍රකට ය

ඒසීඒ-8

**2022 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 12,343,565 | 12,114,708 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5 | 5,250,137 | 5,141,094 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **17,593,702** | **17,255,802** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 5,250,137 | 5,141,094 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 12,343,565 | 12,114,708 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(ඕ) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **17,593,702** | **17,255,802** |

පිටු අංක 07 සිට 26 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
තනතුර : මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.
දිනය : 28/12/2023

ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
2023/02/22
කේ.ඒ. රම්‍යා [illegible]
කොම්ප්ට්‍රොලර් ජනරාල්
කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2023/02/22
ටී. තාරකා එස්. සිල්වා
අධ්‍යක්ෂ
කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය
මහා භාණ්ඩාගාරය
කොළඹ - 01

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒඕඒ-ඕ

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 1,410,520 | 1,260,096 |
| අග්‍රිම ලැබීම් | | 32,448,000 | 25,395,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 2,087,749 | 1,616,272 |
| තැන්පතු ලැබීම් | | 10,050 | 43,448 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 35,956,319 | 28,314,816 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 33,263,758 | 25,061,152 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 236,808 | 282,740 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 321,569 | 501,703 |
| අත්තිකාරම් ගෙවීම් | | 1,838,662 | 2,241,892 |
| තැන්පතු ගෙවීම් | | 10,050 | 43,448 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | 35,670,847 | 28,130,935 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | | 285,472 | 183,881 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | | 285,472 | 183,831 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 285,472 | 183,881 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | | (285,472) | (183,881) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ) | | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

මූල්‍ය ප්‍රකාශන සටහන් නොමැත.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2006.02.01 | මූල්‍ය නොවන වත්කම් විකිණීම - වාහන | 375,000,000 | 375,000,000 | 226,400,016 | 60.37 |
| 2006.02.02 | මූල්‍ය නොවන වත්කම් විකිණීම - වෙනත් | 125,000,000 | 325,000,000 | 357,812,957 | 110.10 |

සටහන:

I. ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු ආයතන කිහිපයකින් මූලික ඇස්තමේන්තුව ඉක්මවා ආදායම් ලැබී ඇති බැවින්, එම අගයන්ද ඇතුලත්කර ඇස්තමේන්තු සංශෝධනය කර ඇත.

II. වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 නිකුත් කරමින්, රජයේ ආයතන වල ධාවන තත්ත්වයේ නොපැවති වාහන අපහරණය කිරීමට උපදෙස් ලබාදුන් අතර ඒ අනුව අපේක්ෂිත ආදායම පදනම් කරගෙන ආදායම් ඇස්තමේන්තු සකස්කරන ලදී. නමුත්, වාහන ගෙන්වීම තවදුරටත් සීමා කිරීම නිසා ඇතැම් ආයතනවල අපහරණය සඳහා හඳුනාගත් වාහන අලුත්වැඩියා කිරීම සහ අදාල ආයතන විසින් අපේක්ෂිත පරිදි අපහරණ කටයුතු සිදු නොකිරීම නිසා 20.06.02.01 ආදයම් කේතය යටතේ තත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩුවී ඇත.

III. ඉහත 2.2 (ඇ) හි සඳහන් පරිදි 2022 අතුරු අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කල වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 මඟින් ලබාදුන් උපදෙස් අනුව අදාල ආයතන විසින් අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම කඩිනම් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් 20.06.02.02 ආදායම් සංකේතය යටතේ  තත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩිවීමට හේතු වී ඇත.

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 35,380,000 | 35,323,500 | 33,589,466 | 95.10% |
| ප්‍රාග්ධන | 230,000 | 286,500 | 285,472 | 99.64% |

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - අදාල නොවේ.

රු. 000'.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | - | - | - | - | - |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

000' රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2022.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | --- | --- | --- | --- |
| 9152 | යන්ත්‍රෝපකරණ | 12,343.57 | 12,343.57 | --- | 100% |
| 9153 | ඉඩම් | --- | --- | --- | --- |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | --- | --- | --- | --- |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | --- | --- | --- | --- |
| 9160 | කෙරීගෙන යන වැඩ | --- | --- | --- | --- |
| 9180 | බදු දෙන ලද වත්කම් | --- | --- | --- | --- |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති වාර්තාව අමුණා ඇත.

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා මධ්‍යගත මාර්ගගත දත්ත පද්ධතිය සකස් කිරීම | | | √ |
| රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා වන මධ්‍යම වත්කම් ලේඛණයෙහි තොරතුරු වාර්තා කිරීම හා ලේඛණගත කර පවත්වාගැනීම. | | | √ |
| රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳව ගැටළු නිරාකරණය කිරීම | √ | | |
| රජයේ මෝටර් වාහන ප්‍රමාණය කළමනාකරණය කිරීම | √ | | |
| රජයේ ආයතනවල මූල්‍ය නොවන වත්කම් අපහරණය කිරීම තුළින් ලැබෙන ආදායම් රැස් කිරීම | √ | | |
| රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම | | √ | |
| පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය | √ | | |

## පරිච්ඡේදය.05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

| පරමාර්ථය | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ දර්ශක ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50-74% | 75-100 % |
| පරමාර්ථ 6 - සැමට ජලය ලැබීම හා තිරසර ජල කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම. | 6.6 2030 වන විට ජලය සමග බැදී පවතින පරිසර පද්ධති වන කඳු, වනාන්තර, තෙත්බිම්, ගංගා, වගුරු බිම් හා වැව් ආරක්ෂා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම. | 6.6.1 කාලය සමඟ ජලය ආශ්‍රිත පරිසර පද්ධතිවල ප්‍රමාණය වෙනස් වීම | 5.2 ඡේදය හා සම්බන්ධ වේ. | | |
| පරමාර්ථ 7 - දරාගත හැකි වූ, විශ්වාසය වූ, තිරසර හා නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම. | 7.2 2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්තීන්හි කොටස ඉහළ නැංවීම. | 7.2.1 සමස්ථ ඉන්ධන පරිභෝජනයේ ප්‍රතිශතයක් ලෙස පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණය. | 5.2 ඡේදය හා සම්බන්ධ වේ. | | |
| පරමාර්ථ 8 - අන්තර්ග්‍රහණීය සහ තිරසර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියාවක් හා සැමට ගෞරවනීය වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම. | 8.1 ජාතික තත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් 7% ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම | 8.1.1 ඒක පුද්ගල තථ්‍ය ද.දේ.නි. වාර්ෂික වර්ධනය | 5.2 ඡේදය හා සම්බන්ධ වේ. | | |
| පරමාර්ථ 11 - නගර හා මානව ජනාවාස අන්තර්ග්‍රහණය, ආරක්ෂිත ප්‍රත්‍යස්ථ හා තිරසාර බවට පත්කිරීම. | 11.3 2030 වන විට, සියලුදෙනා අන්තර්ග්‍රහණය වූ සහ තිරසර නාගරීකරණය දියුණු කිරීම සහ සියලුම.රටවල සහභාගීත්ව, ඒකාබද්ධ හා තිරසාර මානව ජනාවාස සැලසුම් කිරීම, සහ ධාරිතාවන් වැඩි දියුණු කිරීම | 11.3.1 භූමි පරිභෝජන වේගය සහ ජනගහන වර්ධන වේගය අතර අනුපාතය. | 5.2 ඡේදය හා සම්බන්ධ වේ. | | |
| පරමාර්ථ 12- තිරසර පරිභෝජන හා නිශ්පාදන රටා තහවුරු කිරීම | 12.7 ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවයන්ට අනුව තිරසාර වන රාජ්‍ය ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම. | 12.7.1 තිරසර වන රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කරනු ලබන රටවල් ගණන. | 5.2 ඡේදය හා සම්බන්ධ වේ. | | |
| පරමාර්ථ 15. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කරගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම, | 15.1 2030 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂයෙන් වනාන්තර, තෙත් බිම්, කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර | 15.1.1 සමස්ථ ඉඩම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස වනාන්තර බිම් ප්‍රමාණය. | 5.2 ඡේදය හා සම්බන්ධ වේ. | | |

| | | | |
|---|---|---|---|
| කාන්තාරකරණය වැලැක්වීම, භූමි හායනය වලක්වා එය ප්‍රතිවර්ථනය කිරීම හා ජෛව විවිධත්වය අහිමිවීම නැවැත්වීම. | අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.<br><br>**15.2** 2030 වන විට සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්වයට පත්කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම. | **15.2.1** වනාන්තර තිරසර කළමනාකරණය සඳහා වන ප්‍රගතිය. | |
| පරමාර්ථ 17- තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ සහ නව ජීවයක් දීමේ මාර්ග ශක්තිමත් කිරීම. | **17.1** බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය ශක්තිමත් කිරීම. | **17.1.1** ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස රජයේ සමස්ථ ආදායම, මූලාශ්‍රයන් අනුව. | මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය ඇස්තමේන්තු කළ ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස තථ්‍ය ආදායම 83% ක් (රු.මිලි. 584.2) වේ. |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආර්ථික හා සමාජ සංවර්ධනය ඉලක්ක කර ගනිමින් හඳුන්වා දී ඇති එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය ආයතන විසින් සපුරා ගත යුතු වේ. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ විෂය පථය සෘජුවම තිරසර සංවර්ධන අරමුණු වෙත සම්බන්ධ නොවේ. කෙසේ වුවද, ඵලදායී ලෙස රජයේ මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීම සහතික කරමින් රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය විධිමත් පරිදි සිදුකිරීම තුළින් තිරසර සංවර්ධන ඉලක්ක මගින් බලාපොරොත්තු වන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට අනුගත විය හැකි වේ. ඒ අනුව, රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සහ මධ්‍යම රජයේ ආයතන සතු මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම් සඳහා ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කිරීම මගින්, ඉහත 5.1 හි හඳුනාගෙන ඇති පරිදි ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය දායක වේ.

රාජ්‍ය ආයතන විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ වලට නියමිත කාලසීමාව තුළ අදාල තොරතුරු නිවැරදිව ඉදිරිපත් නොකිරීම හා රජයේ මූල්‍ය නොවන වත්කම් වලට අදාල මධ්‍යගත මාර්ගගත (online) දත්ත පද්ධතියක් සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා වන බාධාවන්, අභියෝගයන් ලෙස හඳුනාගෙන ඇත.

## පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 13 | 08 | 05 |
| තෘතීයික | 02 | 01 | 01 |
| ද්විතියික | 18 | 16 | 02 |
| ප්‍රාථමික | 07 | 06 | 01 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟය / අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සේවයේ අවශ්‍යතාවය අනුව තනතුරු පුරප්පාඩු පිරවිය යුතු වේ.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු '000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන | 01 | දින 14 | - | - | දේශීය | 1. පරිපාලනය සංවර්ධනය සඳහා උපාය මාර්ගිකව සිතීමේ හැකියාව වර්ධනය වීම.<br>2. පරිපාලනමය කටයුතු සම්බන්ධ දැනුම වර්ධනය වීම. |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු '000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන | 01 | දින 14 | - | - | දේශීය | 1. මුදලට වටිනාකම් ලබා දීමේ නීතිමය ක්‍රමවේදයන්<br>2. ප්‍රසම්පාදනය හා ගිවිසුම් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමේ ක්‍රම |
| 3. වෘත්තිකයන් සඳහා වන ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 | පැය 180 | - | - | දේශීය | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම |
| 4. ධාරිතා සංවර්ධන වැඩසටහන - I | 20 | දින 01 | 70.5 | - | දේශීය | පුද්ගල පෞරුෂය හා ආකල්ප සංවර්ධනය සම්බන්ධ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම |
| 5. ධාරිතා සංවර්ධන වැඩසටහන - II | 26 | දින 01 | 32.3 | - | දේශීය | 1. විශ්‍රාම වැටුප් සම්බන්ධ මූලික දැනුම<br>2. විශ්‍රාම වැටුප් සකස් කිරීම සම්බන්ධ දැනුම<br>3. තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධ මූලික දැනුම |
| 6. නිරබාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පුහුණුව | 01 | දින 02 | - | - | දේශීය | බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධ දැනුම |

## පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අදාල නොවේ | | |
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | සංචිත වාහන නොමැත | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අදාල නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධ යෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාල නොවේ | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | යමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාල නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **11** | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මූ.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අදාල නොවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මූ.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක. 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/B/CGO/2/22/17 මබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023 අප්‍රේල් 28 දින

ගණන්දීමේ නිලධාරී

කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය

**ශීර්ෂය 333 - කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 333 - කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

වැය විෂයයන් 04ක මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.1,739,000 ක් එනම් මූලික ඇස්තමේන්තුවෙන් සියයට 35 සිට සියයට 455 ක් දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

රජයේ සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම තුළින් රජයේ වත්කම් කළමනාකරණය, වත්කම් පිළිබඳ පිරිවැය කළමනාකරණය හා අධීක්ෂණය කිරීම අරමුණු කොටගෙන 2017 වර්ෂයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය යෝජනාවක් අනුව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා තිබුණි. ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, නැව්, ගුවන් යානා, යන්ත්‍රෝපකරණ ආදිය ද ඇතුළත් දේශීයව හා විදේශීයව රජය සතු සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය ඉටු කළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා 2022 දෙසැම්බර් 31 දින වන විට වසර 05 ක් ඉක්මගොස් තිබුණ ද, ඉහත දක්වන ලද සියලු වත්කම් ඇතුළත් කොට මධ්‍යගතව ලේඛනගත කිරීමක් සිදු කිරීමට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට නොහැකි වී තිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විධිමත් පවරා ගැනීමකින් තොරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සතු වාහන 03 ක් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා භාවිතයට ගෙන තිබුණි.

(ආ) කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ වායු සමීකරණ 06 ක් සේවා කිරීම සඳහා 2019 නොවැම්බර් මස සිට 2020 ඔක්තෝබර් මාසය දක්වා වසරක කාලයක් සඳහා සේවා කිරීමට පෞද්ගලික ආයතනයක් සමඟ එකඟතාවයකට පැමිණ තිබුණ ද, ඒ සඳහා විධිමත් ගිවිසුමක් ඇතිකරගෙන නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ පුරප්පාඩු 09 ක් පැවති අතර, එම පුරප්පාඩු අතරින් 05 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු විය.

බී.ඔ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට